සැලසිනෙ ටෙලිවිෂන් සේවය
SELACINE
SELACINE TELEVISION INSTITUTE

2019

වාර්ෂික වාර්තාව

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව - 2019</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07

පෙළ ගැස්ම

දැක්ම, මෙහෙවර, අරමුණු	05
සභාපතිතුමාගේ සමාලෝචනය	07
ආයතනික තොරතුරු	08
පරිපාලන ව්‍යුහය 2019 හා සම්බන්ධ තොරතුරු	09
මූල්‍ය වාර්තා - 2019	13
මූල්‍ය වාර්තා සඳහා සටහන්	16
ආදායම් ප්‍රකාශය	18
ශේෂ පත්‍රය	19
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	20
මූල්‍ය වාර්තා සඳහා සටහන්	22
2019 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය	32

දැක්ම, මෙහෙවර සහ අරමුණු

මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනඟි සේවාවක් සැපයීම තුළින්

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට 2021 දෙසැම්බර් මස 31 වැනි දින පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වනු ලබන 2019 වාර්ෂික වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීම සම්බන්ධයෙන් සතුටු වෙමි.

පසුගිය වසර 37 ක කාල සීමාව දෙසට හැරී බැලීමේ දී සැලසිනෙ ආයතනය අලෙවි, මූල්‍ය, පරිපාලන, නිෂ්පාදන, ඉසව්, අධිවේගී නිර්මාණ යන අංශයන්ගෙන් සැලකිය යුතු පරිදි දක්ෂතා ඔපමට්ටම් කර ගැනීමට හැකි වී ඇත.

2019 වාර්ෂික ආදායම ලෙස රු.මිලි 634.3 ක් ලෙස සැලසිනෙ ආයතනය උපයාගෙන ඇති අතර, එම වසරේ ලාභය රු.මිලි 8.3 කි. 2019 වසර හා සැසඳීමේ දී 2018 වසරේ ආදායම රු.මිලි 597.8 ක් ලෙස දැක්වෙන අතර, එම වසරේ රු.මිලි 29.7 ක ලාභයක් උපයා ගැනීමට සමත්ව තිබේ.

ග්‍රැෆික් අංශය විසින් නිර්මාණාත්මක දැන්වීම් සිදු කිරීම, මාධ්‍ය අංශය විසින් දැන්වීම් උපලේඛනගත කිරීමේ දී වැඩි දායකත්වයක් ලේක්හවුස් ආයතනය සමඟ එක්ව ඉතා වැඩි වටිනාකමකින් යුතු දැන්වීම් ප්‍රචාරය කිරීමට සමත්වීම මත මෙම වර්ෂයේ උපලේඛනගත ආදායම ඉහළ මට්ටමක් පෙන්නුම් කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ ද විගණකාධිපතිගේ මතය යහපත් ලෙස සනිටුහන් කිරීම එයට කදිම නිදසුනකි. මෙම තත්වය ඉදිරියටත් පවත්වාගෙන යෑම සඳහා මූල්‍ය අංශය විසින් කැප වී කටයුතු කරන ආකාරය පෙන්නුම් කෙරේ.

මෙම තත්වය ලඟාකර ගත හැක්කේ ශක්තිමත් කළමනාකරණ වැඩපිළිවෙලක් යොදවා මෙම ආයතනය ලාභ ඉපයීමේ මාර්ගයකට ප්‍රවේශ කිරීම කෙටි කාලීනව සේවකයින්ගේ දක්ෂතා හඳුනාගෙන ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීමට යම් යම් ක්‍රියාමාර්ග ගෙන නිසි ක්‍රමවේදයන් යෙදීම මගින් බව කිව යුතුය.

මේ වනවිට රට මුහුණ දී සිටින කොවිඩ් තත්වය හමුවේ ආයතනයේ ආර්ථික පසුබිම ගොඩනැංවීමෙහිලා විශේෂ සැලසුමක් මේ වනවිටත් ආයතනයක් ලෙස සැලසිනෙ දියත්කර තිබීම සතුටට කරුණකි. වී ඔස්සේ මූල්‍ය ප්‍රතිලාභ ඉපයීම පමණක් නොව රජයේ ප්‍රචාරණ මාධ්‍ය යාන්ත්‍රනය වඩාත් ඵලදායී මෙහෙවරක යෙදීම ද අපගේ අපේක්ෂාව වී ඇත.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආයතනික තොරතුරු

නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම.
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවේදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
    - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
    - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
    - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

පරිපාලන ව්‍යුහය - 2019

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

ඩෙන්වර් ප්‍රනාන්දු	- සභාපති (වැ.බ)	(2019.03.21 - 2019.04.30)
ප්‍රභාත් සී පෙරේරා	- සභාපති	(2019.05.02 - 2019.12.12)
ඒ.එච් ලක්ෂාන් ද සොයිසා	- සභාපති (වැ.බ)	(2019.12.13 - 2020.12.31)

එච්.එම් මංජුල හේරත් - සාමාන්‍යාධිකාරී

කළමනාකරණය

එච්.එම්.යූ.සී.පී හේරත් මහතා	- කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)	(2018.10.15 - 2020.01.31)
පුෂ්පා බමුණුආරච්චි මිය	- කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)	(2019.07.03 - 2020.09.21)
සුනන්ද වීරසිංහ	- කළමනාකරු (ශ්‍රව්‍ය/දෘෂ්‍ය) නිෂ්පාදන	
අග්බෝ අමරසේකර	- ප්‍රධානී (ව්‍යාපාර සංවර්ධන)	
නලින් අලහකෝන්	- කළමනාකරු (මාධ්‍ය)	
ශාන්ත ලොකුකැටගොඩ	- ගණකාධිකාරී	
සුපිත් පුෂ්පකුමාර	- කළමනාකරු (ග්‍රැෆික්)	
අයි.විල්.පී ප්‍රනාන්දු	- කළමනාකරු (අධිවේගී මුද්‍රණ)	
ඉන්දික විජේතුංග	- කළමනාකරු (මිලදී ගැනීම් හා සැපයුම්)	
ප්‍රභාත් කහදුවආරච්චි	- කළමනාකරු (ඉසව්)	

විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

සම්බන්ධීකරණ තොරතුරු

ලිපිනය	-	අංක. 380/57, සරණ පාර, කොළඹ 07
දුරකථනය	-	011-4320777, 011-4061586
ෆැක්ස්	-	011-2058229
විද්‍යුත් තැපෑල	-	selacine@gmail.com
වෙබ් අඩවිය	-	www.selacine.lk

නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

නිර්මාණ සහ ග්‍රැෆික් අංශය වෙළෙඳ ප්‍රචාරණ ක්ෂේත්‍රයේ සිටින ඕනෑම ආයතනයක ප්‍රබලම අංශ අතරින් එකක් බව අවිවාදිතව පිළිගන්නට සිදුවේ. සැලසිනෙ රූපවාහිනී ආයතනයේ මුද්‍රිත මෙන්ම සජීවීකරණ නිර්මාණ ක්‍රියාවලියේදී ප්‍රමුඛ කාර්යයක් ඉටු කෙරෙන්නේ ග්‍රැෆික් නිර්මාණ අංශයෙනි. එහිදී ප්‍රචාරක බිත්ති දැන්වීම්, පුවත්පත් දැන්වීම්, බිල්බෝඩ්, ඇතුළු පුළුල් ක්ෂේත්‍රයක අප කාර්යයන් පැතිරී තිබේ.

මෙම අංශය නිරන්තර නව දැනුමෙන් මෙන්ම නිර්මාණශීලී තාක්ෂණයෙන් ද පෝෂණය ලබමින් ඉදිරියට යා යුතු තරගකාරී ක්ෂේත්‍රයකි.එනිසාම අප අංශයේ සියලුම නිර්මාණවේදීන් ඒ පිළිබඳ නිරන්තර යාවත්කාලීන වෙමින් කටයුතු කරන පිරිසකි. නිරන්තර කාර්යක්ෂම කාර්යභාරයක නිරතව සිටින අප කාර්යය මණ්ඩලය සැලසිනෙ ආයතනයේ වාර්ෂික ආදායම් ඉලක්ක සපුරා ගැනීමේ දී ආයතනයේ සෙසු අංශ සමග අත්වැල් බැඳ ගන්නේ ඕනෑම අසීරු ඉලක්කයක් වෙත යාමට ඇති දැනුම සහ ශක්තිය එක් කරමින්ය. ග්‍රැෆික් නිර්මාණ අංශයේ කාර්යය භාරය කාර්යාල වේලාවට පමණක් සීමා වන්නක් නොවන්නේ මෙම අංශය නිර්මාණාත්මක ගුණය මතම රැඳී ඇති නිසාය.එහිදී ආයතනයේ නිර්මාණාත්මක කාර්යයභාරයට අප අංශයෙන් විශාල දායකත්වයක් සැපයීම අනිවාර්යය වූවකි.ඒ සඳහාම කැපවූ කාර්යය මණ්ඩලයක් අප සතුව සිටී.

ලෝකයේ ග්‍රැෆික් නිර්මාණ ක්ෂේත්‍රය තාක්ෂණික වශයෙන් ද දැවැන්ත පිම් පනිමින් ඉදිරියට යන ක්ෂේත්‍රයකි. එහිදී එම තාක්ෂණික පිම් මගහරිමින් කටයුතු කිරීමේ හැකියාවක් අප වෙත නොමැත්තේ තරගකාරීත්ව තුළින් ඉදිරියට යාමේ දී සැලසිනෙ ආයතනය ද එම ඉලක්ක වෙත ලගා වියයුතු නිසාය. රජයේ දැන්වීම් රැසක් වාර්ෂිකව අප ආයතනයේ නිර්මාණාත්මකව සැකසීමේ වගකීම පැවරී ඇත්තේ ග්‍රැෆික් නිර්මාණ අංශයටය. එහිදී වාර්ෂිකව නිර්මාණය කරන පුවත්පත් දැන්වීම සංඛ්‍යාව විශාලය.මෙම දැන්වීම සැකසීමේ දී සේවාදායකයාගේ අවශ්‍යතාව තේරුම් ගෙන සැකසීම ද අභියෝග යකි. ගතවූ කාලය තුළ අප එම අභියෝග සාර්ථකව ජයගනිමින් ආයතනයේ කීර්තිනාමය ඉහළින් රඳවා ගැනීමට උපරිම දායකත්වය සපයා දී තිබේ.

2019 වසරේ වාර්ෂික වාර්තාව නිකුත්වන මේ මොහොතේ නව සභාපතිතුමාගේ දැක්ම සහ ඉලක්ක වෙත යාම සඳහා සහෝදර අංශ සමග වඩාත් සුහදශීලීව සේවාදායක අවශ්‍යතා සපුරාලීම සඳහා ග්‍රැෆික් නිර්මාණ අංශය අත්වැල් බැඳගෙන ක්‍රියාකරමින් සිටිමු. පෙර වසර වලටත් වඩා වැඩි කාර්යයභාරයක් ඉටු කිරීම සඳහා අප අංශය නව කළමණාකාරීත්ව දැක්මක් සහිතව ආයතන ඉලක්ක කාර්යය මණ්ඩල සාමාජිකයින් වෙත ලබාදෙමින් කැපවී ක්‍රියාකරමින් සිටින්නෙමු.

මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම් සහ සමාජ මාධ්‍යයන්හි ප්‍රචාරයන්ය. එය සෑම වර්ෂයකම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුළිනි. ඒ අනුව 2019 වර්ෂයේද වඩාත් කාර්යක්ෂමව සිදුකරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 375,524,279.55 කි.

2019 වර්ෂයේද ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබා දෙන ලදී. ඒ අනුව අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලබාදෙන ලදී.

තවද රූපවාහිනී හා ගුවන්විදුලි උපලේඛනගත කිරීම් සඳහා අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලැබෙන අතර මීට අමතරව වර්තමානය වන විට සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවි තුළ ප්‍රචාරණ කාර්යයන් සිදුකිරීම ඉතාමත් ආකර්ෂණීය අංගයක් බවට පත්ව ඇත. ඒ අනුව අපගේ මාධ්‍ය අංශයෙහි සමාජ මාධ්‍ය අංශයක් වෙනම ඇත. එහිදී අපගේ නිර්මාණාත්මක කාර්යයන් ප්‍රචාරය කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහළ මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

අලෙවි හා පාරිභෝගික සේවා අංශය

2019 වර්ෂය අභියෝගාත්මක වසරක් වූ අතර දෙපාර්තමේන්තුවට ද නව බඳවා ගැනීම් සිදු විය.

පසුගිය වසරට සාපේක්ෂව සමස්තයක් ලෙස මෙම ඉසව්වේ සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබේ. විකුණුම් ආදායම රුපියල් මිලියන 634,368,092.16 ක් ලබා ගැනීමට එය ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත.

මානව සම්පත් හා පරිපාලන අංශය

අපගේ ඉහළම සම්පත හා වත්කම වන්නේ ආයතනයේ මානව සම්පතයි. ආයතනයේ ඉදිරි දැක්මේ ඉලක්කයන් සපුරා ගැනීමට යන ගමනේ මානව සම්පත තුළින් උපරිම දායකත්වය ලබා ගැනීමට පරිපාලන අංශය වෙතින් 2019 වර්ෂය සඳහා සිදු කරන ලද මෙහවර මෙසේය.

- වසර 37 ක දිගුකාලීන ඉතිහාසයකට උරුමකම් කියන සැලසිනෙ ආයතනය නීතිගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර අවසන් අදියරේ පවතියි. ඊට අමතරව ආයතනික ව්‍යුහය නව ප්‍රචාරක ආයතන හා තරඟකාරීත්වයට මුහුණ දීමේ අභියෝගය කෙරෙහි සැලකිලිමත් වී සකස් කිරීම හා බඳවා ගැනීමේ ක්‍රමවේදයන් විධිමත්ව සිදු කිරීමටද කටයුතු කර ඇත.
- අබණ්ඩ පුහුණු වැඩසටහන් සහ උද්යෝගය වැඩි දියුණු වන ආකාරයේ පරිසරයක් ගොඩනැගීම තුළින් ආයතනික කාර්ය මණ්ඩලයේ උද්යෝගිමත් බව වැඩි දියුණු කිරීම. එමෙන්ම, ඔවුන් සතු උපරිම හැකියාවන් පිළිබඳ ඔවුන්ට හැඟීමක් සහ විශ්වාසයක් ඇති කර වීම සහ ආයතනික කාර්යයන් වෙත ඔවුන්ගේ උපරිම දායකත්වය ලබා ගැනීම තුළින් ඵලදායිතාවය වැඩි දියුණු කර ගැනීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සුභ සාධනය වෙනුවෙන් ඉහළ ප්‍රතිලාභ වලින් යුතු සෞඛ්‍ය රක්ෂණ ක්‍රමවේදයක් ලබා දීම, සේවක ණය ලබා දීම, උත්සව අත්තිකාරම්, ප්‍රසාද දීමනා ලබා දීම තුළින් සේවකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඉහළ සේවාවන් ලබා දීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය කාර්යාලයීය උපකරණ හා ලිපි ද්‍රව්‍යයන් කඩිමින් ලබා දීමටද කටයුතු කර ඇත.

නිෂ්පාදන අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සමාරම්භය සනිටුහන් කරන්නේ ශ්‍රව්‍ය දෘෂ්‍ය නිෂ්පාදන අංශයයි. විදුවස සංවර්ධන ව්‍යාපෘතීන් ජනගත කිරීම උදෙසාම වාර්තා වැඩසටහන් හා ප්‍රචාරක පට නිෂ්පාදනයෙහිලා පුරෝගාමී නිෂ්පාදන ආයතනය ලෙස ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රයේ මංසලකුණු තැබූ වේ සැලසිනේ ආයතනයයි.

සැලසිනේ ආයතනයේ අඩිතාලම වූ නිෂ්පාදන අංශය මගින් නව්‍ය තාක්ෂණය හා මුසු වෙමින් 2019 වසරේ දී රාජ්‍ය ආයතනයන් හි විවිධ වැඩසටහන් ජනගත කිරීමෙහිලා සුවිශේෂී කාර්යයක් සිදු කර ඇති බැව් සටහන් කිරීම වටී.

ඒ අතරින් බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය ආදී ආයතනයන් සඳහා වාර්තා වැඩසටහන්, තවද දැන්වීම් හා ප්‍රචාරක, නිර්මාණ හා නිෂ්පාදන ප්‍රමුඛ තැනක් ගනී.

යාවත් කාලීන වෙමින් නිෂ්පාදන අංශය විසින් පෙරටත් වඩා ඉදිරියට පියවර තැබීමේ අපේක්ෂාවෙන් සිටී.

මූල්‍ය අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සියලු මූල්‍ය කටයුතු සිදුකරනු ලබනුයේ මූල්‍ය අංශය මගිනි. 2019 වසර ද මූල්‍ය අංශයේ සුවිශේෂී වර්ෂයක් ලෙස හැඳින්විය හැක. මෙම වර්ෂය තුළ දී ගිණුම් කටයුතු යථා තත්වයට ගෙන ඒමට වැඩි වෙහෙසක් දැරීමට සිදු විය. මූල්‍ය අංශයේ සියලු කාර්යයන් කාර්යක්ෂව ක්‍රියාත්මක කිරීම උදෙසා නව විධික්‍රම හඳුන්වා දීම සිදු විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලුම ගිණුම් කටයුතු සිදු කරනු ලැබීය. ගෙවිය යුතු ණය මුදල් රාශියක් සැපයුම්කරුවන් වෙත නියමිත පරිදි ගෙවීමට හැකිවිය. ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කෙරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විගණන විමසුම් අඩුකර ගැනීමට හැකි විය. පැරණි වර්ෂවල ගිණුම් වාර්තා සියල්ල පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම ද අප ලද ජයග්‍රහණයකි.

ගිණුම් වාර්තා සැකසීම, තොරතුරු අමාත්‍යාංශය හා විගණනය වෙත කඩිනමින් ලබා දීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශ්වයන් වෙත කඩිනමින් ලබා දීමට පියවර ගනු ලැබේ. විගණකාධිපතිගේ මතය 2014, 2015, 2016, 2017, 2018 යන වර්ෂවලදී මෙන්ම 2019 වර්ෂයේදී ද රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බැව් එකී විගණකාධිපති වාර්තාවේ සඳහන් වීම තුළින් මූල්‍ය අංශය මගින් සැලසිනෙ රූපවාහිනී ආයතනය වෙත ඉමහත් කීර්තියක් ලබා දී තිබේ.

ඉසව් කළමනාකරණ අංශය

සැලසිනෙ රූපවාහිනි ආයතනයේ සුවිශේෂී අංශයක් ලෙස ඉසව් අංශය හැඳින්විය හැක. රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි දැවැන්ත ඉසව් කළමණාකරණය කිරීම මෙම අංශයෙන් සිදුවේ. 2019 වර්ෂයේ අප ආයතනය සිදු කල ඉසව් අතර ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ නෙළුම් කුළුන විවෘත කිරීමේ මහෝත්සවය රුපියල් මිලියන 9 ක මූල්‍ය වටිනාකමකින් යුක්ත විය. එමෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලක්ෂ 6 ක ප්‍රතිලාභින්ට සමෘද්ධි සහනාධාරයක් ලබාදීමේ උත්සව 22 ක් දිස්ත්‍රික්ක 22 ක රු. මිලියන 11 ක මූල්‍ය වටිනාකමක් යටතේ සිදුකරන ලදී. තවද මුදල් අමාත්‍යාංශය මගින් සංවිධානය කල අහන්න වැඩසටහන අද්‍යර 3 ක් යටතේ අනුරාධපුර, යාපනය යන දිස්ත්‍රික්කයන්හි රු. මිලියන 5.9 ක මූල්‍ය වටිනාකමකින් සිදු ලදී. එමෙන්ම බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ ඇමේසන් ශ්‍රී ලංකා 2019 සම්මාන උළෙල රු. මිලියන 1.3 ක මූල්‍ය වටිනාකමකින් සිදුකරන ලදී. එලෙසම මුදල් අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබූ එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේ වෙළඳ කුටි නිර්මාණය රු. මිලියන 3.9 ක මූල්‍ය වටිනාකමනින් යුක්ත විය. 2018 වර්ෂයට සාපේක්ෂව මෙම වසරේ ඉසව් අංශයේ වැඩි දියුණුවීමක් පෙන්නුම් කරන අතර 2020 වර්ෂය වන විට නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් නව ඉසව් කළමණාකරණ ක්‍රමවේදයන් අප හඳුන්වා දීමට නියමිත අතර අපේක්ෂිත ආදායම තවත් ඉහල නැංවීමට සූදානම්ය.

මූල්‍ය වාර්තාව 2019

ආදායම් වර්ධනය



පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදමෙහි ප්‍රවණතාවය



2015 - 2019 වසර අතර ආයතනික ලාභයේ උපනතිය



මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2019.02.26 වෙනි දිනැති අංක 2112/13 දරන විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රමාණය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමණාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

1.3 සේවක ප්‍රමාණය

2019.12.31 වන දිනට 67 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙම ණය පිරිවැය හදුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම

3.1 දේපල පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළඳ සහ ලැබිය යුතු දෑ

වෙළඳ සහ ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

එක් එක් අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත පරිදි වන අතර එහි පවත්නා ඇස්තමේන්තු ඵලදායී කාලය සහ සාපේක්ෂ කාලය පහත පරිදි වේ.

ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10
පරිගණක උපකරණ	වර්ෂ 05
කාර්යාලීය උපකරණ	වර්ෂ 10
මෝටර් වාහන	වර්ෂ 05
කැමරා සහ චිත්‍රපට උපකරණ	වර්ෂ 10
පරිගණක මෘදුකාංග	වර්ෂ 10

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 වගකීම් වර්ගීකරණය වන්නේ ඉල්ලුම මත ගෙවීමට බැඳී සිටින පවත්නා ශේෂ පත්‍රයේ වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ය. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් ලෙස අයිතම වර්ගීකරණය වී ඇත.

4.2 විශ්‍රාම සහ ප්‍රතිලාභ දීමනා

සේවක ප්‍රතිලාභ - LKAS 19 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන ප්‍රතිලාභ දීමනා පනතට අනුකූලව වී යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාව සහ රෙගුලාසිවලට සමගාමීව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබනු අතර ආයතනය විසින් 15% ක සහ 3% ක් සේවකයින්ගේ මුළු වේතන ප්‍රමාණයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වේ.

5 ආදායම් ප්‍රකාශය

5.1 පිරිවැටුම

සැලසිනෙ පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, මුද්‍රණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමණාකරණ, සමාජ මාධ්‍ය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සසම්භාවී ලෙස ගලා ඒමේ ප්‍රමාණය සහ ආදායම් විශ්වාසී ලෙස ගණනය කිරීම ආදායම් හඳුනා ගැනීම ලෙස හැඳින්වේ.

5.3 වියදම් හඳුනා ගැනීම

වියදම් හඳුනා ගැනීම ආදායම් ප්‍රකාශනයේ සෘජු සම්බන්ධතාවය අතර පිරිවැය සහ විශේෂී අයිතම සඳහා වූ ආදායම් ඉපැයුම් පදනම මත වියදම් හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

6. අදාළ පාර්ශව අතර ගනුදෙනු

LKAS 24 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාළ පසු ගැලපුම් සටහන්

7.1 මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැලපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

8. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000.00 ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර ඇත.

9. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 2.5% ක් වෙන්කර තිබේ. 2006 වසරේ හඳුනානොගත් ණය ගැතියන් සඳහා අඩමාන ණය සම්පූර්ණයෙන්ම වෙන්කොට ඇත.

10. 10.1 සේවකයන් දෙදෙනෙකුට විරුද්ධව ආයතනය විසින් නීතිමය පියවර ගෙන ඇත.

10.2 මෙහි සඳහන් විගණන විමසුම් වලට අනුව ආයතනයේ වත්කම් නැවත ප්‍රති අගය 2020 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2019 රු.	2018 රු.	2017 රු.
ආදායම්	11	**634,368,092.16**	**597,861,538.10**	**637,351,163.32**
සෘජු පිරිවැය	12	533,238,084.32	490,793,242.38	541,297,909.69
දළ ලාභය / අලාභය		**101,130,007.84**	**107,068,295.72**	**96,053,253.63**
වෙනත් මෙහෙයුම් ආදායම්	13	7,732,399.32	13,822,647.07	4,379,747.31
පරිපාලන හා ආයතන වියදම්	14	(76,773,888.13)	(67,378,237.30)	(71,096,270.58)
ආලවිකරණ හා බෙදාහැරීමේ වියදම්	15	(20,379,230.71)	(21,892,667.18)	(26,231,866.42)
මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය		**11,709,288.31**	**31,620,038.31**	**3,104,863.94**
මූල්‍ය වියදම්	16	(196,806.41)	(224,807.66)	(124,084.60)
වෙනත් වියදම්	17	(3,212,272.49)	(1,690,794.00)	(1,770,342.59)
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය/අලාභය		**8,300,209.42**	**29,704,436.65**	**1,210,436.75**
බදු හර කල පසු ලාභය/අලාභය		**8,300,209.42**	**29,704,436.65**	**1,210,436.75**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය/අනෙකුත් විස්තිරණ ආදායම්		-	-	-
වර්ෂය සඳහා මුළු මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය/අලාභය		**8,300,209.42**	**29,704,436.65**	**1,210,436.75**

ශේෂ පත්‍රය

2019 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2019 රු.	2018 රු.	2017 රු.
වත්කම්				
ජංගම නොවන				
දේපළ පිරියත හා උපකරණ	18	8,819,372.19	9,703,764.59	11,170,153.95
අස්පෘෂ්‍ය වත්කම්	18-A	2,908,740.69	3,559,605.76	3,460,377.76
ගොඩනැගිලි වියදම්		-	1,842,062.05	3,684,124.10
මුළු ජංගම නොවන වත්කම්		**11,728,112.88**	**15,105,432.40**	**18,314,655.81**
ජංගම				
ආයෝජන	19	32,398,200.00	20,898,200.00	898,200.00
වෙළඳ හා ලැබිය යුතු වත්කම්	20	393,767,769.15	465,547,234.05	390,651,319.86
තැම්පතු හා පෙරගෙවුම්	21	1,669,896.08	1,395,510.60	1,662,656.66
මුදල් හා සමාන දෑ	22	27,686,494.15	13,380,385.01	31,416,455.80
ජංගම වත්කම්		**455,522,359.38**	**501,221,329.66**	**424,628,632.32**
මුළු වත්කම්		**467,250,472.26**	**516,326,762.06**	**442,943,288.13**
ස්කන්ධ හා වගකීම්				
ස්කන්ධය				
රඳවාගත් ලාභය / අලාභය		124,389,548.02	109,791,825.84	70,209,475.81
මුළු ස්කන්ධය		**124,389,548.02**	**109,791,825.84**	**70,209,475.81**
වගකීම්				
ජංගම නොවන				
උපචිත පාරිතෝෂික දීමනා	23	16,381,707.17	11,919,393.60	9,692,481.86
කල්බදු ණය පොළී	24	-	-	-
මහාභාණ්ඩාගාර ණය		-	-	-
මුළු ජංගම නොවන වගකීම්		**16,381,707.17**	**11,919,393.60**	**9,692,481.86**
ජංගම				
කල්බදු ණය පොළී	24	-	-	-
වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම්	25	326,349,665.07	394,485,990.62	362,911,778.46
මහාභාණ්ඩාගාර ණය		-	-	-
අත්තිකාරම් ලැබීම්		129,552.00	129,552.00	129,552.00
මුළු ජංගම වගකීම්		**326,479,217.07**	**394,615,542.62**	**363,041,330.46**
මුළු ස්කන්ධ හා වගකීම්		**467,250,472.26**	**516,326,762.06**	**442,943,288.13**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සමානාධිකාරී - සැලසිනෙ රූපවාහිනී ආයතනය

මෙම මූල්‍යමය ප්‍රකාශය සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබන ලදී.

සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය		
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය	8,300,209.42	29,704,436.65
ගැලපීම්;		
බදු පොලී	-	-
පොලී ආදායම්	(4,035,768.29)	(536,796.08)
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම්	2,897,602.30	3,170,873.00
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	4,766,131.08	2,797,621.74
දේපල අපහරණය කිරීමෙන් ලද ලාභය / අලාභය	(1,376,057.00)	-
පසුගිය වර්ෂයට අදාළ ගැලපීම්	6,297,512.76	9,877,913.38
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**16,849,630.27**	**45,014,048.69**
වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්)	72,207,297.84	(73,122,256.14)
තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(274,385.48)	267,146.06
වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(68,136,325.55)	31,574,212.16
ලද අත්තිකාරම් (වැඩිවීම් / අඩුවීම්)	-	-
ගොඩනැගිලි වියදම් සඳහා ප්‍රතිපාදන (වැඩිවීම් / අඩුවීම්)	-	-
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්	**20,646,217.08**	**3,733,150.77**
පාරිතෝෂික ගෙවීම්	(303,817.51)	(570,710.00)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**20,342,399.57**	**3,162,440.77**
ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්		
දේපල පිරිවිත, යන්ත්‍රාගාර හා උපකරණ මිලදී ගැනීම්	1,427,941.28	(1,735,307.64)
පොලී ආදායම්	4,035,768.29	536,796.08
ස්ථාවර තැම්පතු	(11,500,000.00)	(20,000,000.00)
ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**(6,036,290.43)**	**(21,198,511.56)**
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර ණය ලැබීම් / ආපසු ගෙවීම්	-	-
ණය ආපසු ගෙවීම්	-	-
බදු ගෙවීම් නිවැරදි කිරීම්	-	-
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**-**	**-**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම	**14,306,109.14**	**(18,036,070.79)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	13,380,385.01	31,416,455.80
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	**27,686,494.15**	**13,380,385.01**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.
සටහන A		
මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299	3,078,297.75	7,540,695.27
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765	327,395.69	315,207.27
මහජන බැංකුව 200100130005980	(3,652,842.49)	3,467,878.97
මහජන බැංකුව 200100110005980	27,571,332.74	-
නිශ්පාදන අත්තිකාරම්	141,808.50	1,881,603.50
අනෙකුත් අත්තිකාරම්	220,501.96	175,000.00
	27,686,494.15	**13,380,385.01**

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.
	රදවාගත් ලාභය
2019 ජනවාරි 1 දිනට ශේෂය	109,791,825.84
පෙර වර්ෂයට අදාල ගැලපීම් (සටහන 28)	6,297,512.76
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය	8,300,209.42
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**124,389,548.02**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.	2017 රු.
සටහන - 11 - ආදායම්			
නිශ්පාදන	59,618,406.45	64,274,782.71	32,661,878.25
ග්‍රැෆික්	50,717,765.80	44,104,237.11	48,299,073.00
උපලේඛනගත කිරීම්	375,524,279.55	435,925,412.29	405,675,446.93
ඉසව්	148,333,815.36	52,042,205.99	150,487,265.14
වෙනත්	-	7,500.00	82,500.00
වෙබ්	173,825.00	1,507,400.00	145,000.00
	634,368,092.16	**597,861,538.10**	**637,351,163.32**
සටහන - 12 - සෘජු පිරිවැය			
නිශ්පාදන වියදම්	38,654,700.00	43,229,765.58	28,656,917.64
ග්‍රැෆික් වියදම්	36,176,902.33	40,018,353.15	33,511,635.16
උපලේඛනගත වියදම්	316,005,865.04	358,077,255.35	347,405,543.49
ඉසව් කළමනාකරණ වියදම්	142,256,802.84	48,115,268.30	131,586,313.40
වෙබ් අඩවි වියදම්	143,814.11	1,352,600.00	137,500.00
වෙනත් වියදම්	-	-	-
	533,238,084.32	**490,793,242.38**	**541,297,909.69**
සටහන - 13 - වෙනත් මෙහෙයුම් ආදායම්			
විශේෂ කොමිස් ලැබීම්	-	12,097,784.00	-
සේවක ණය පොළී	135,682.65	136,066.99	116,790.59
බැංකු පොළී	4,035,768.29	536,796.08	99,309.82
වත්කම් විකිණීමේ (ලාභය/අලාභය)	821,491.38	-	-
වෙනත් ආදායම්	1,566,457.00	243,000.00	3,531,849.90
සැපයුම්කරුවන් ලියාපදිංචිය	1,078,000.00	632,000.00	312,000.00
පරිවර්තන ගාස්තු	10,000.00	75,000.00	-
නිර්මාණ ගාස්තු	85,000.00	65,000.00	281,000.00
ප්‍රවාහන ගාස්තු	-	37,000.00	38,797.00
	7,732,399.32	**13,822,647.07**	**4,379,747.31**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.	2017 රු.
සටහන - 14 - පරිපාලන හා ආයතන වියදම්			
දීමනා	17,000.00	16,400.00	-
දීමනා - සභාපති	1,102,083.34	1,447,555.64	1,547,928.00
දීමනා - කොන්ත්‍රාත්	156,009.98	673,180.88	945,924.66
දීමනා - පුහුණු	131,250.00	120,250.00	176,250.00
දීමනා - ප්‍රවාහන	802,688.14	800,000.00	900,000.00
දීමනා - ඉන්ධන	505,766.66	329,110.32	290,065.26
දීමනා - දුරකතන	179,333.32	150,548.39	156,000.00
විගණන ගාස්තු	1,194,000.00	250,000.00	120,000.00
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	29,974.00	13,604.00	-
දීමනා - අධ්‍යක්ෂක මණ්ඩල	105,000.00	142,500.00	45,000.00
ප්‍රසාද දීමනා	1,816,822.10	1,293,348.00	662,125.00
ගොඩනැගිලි වියදම්	1,842.062.05	1,842,062.05	1,842,062.04
ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපට සංස්ථාව	3,780,000.00	3,780,000.00	3,780,000.00
ගොඩනැගිලි කුළී වියදම් - රාජගිරිය කාර්යාලය	-	-	733,335.84
පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම්	71,220.00	103,298.94	80,186.00
පරිගණක අලුත් වැඩියා වියදම්	12,400.00	217,750.00	26,480.00
උපදේශක ගාස්තු	-	17,415.00	50,000.00
ක්ෂය වීම්	2,246,737.23	2,421,396.00	2,641,533.37
අධ්‍යක්ෂක චේතන	526,779.02	484,408.69	505,500.00
ආධාර	450,000.00	207,500.00	553,400.00
විදුලිය	760,659.83	705,469.10	790,952.95
සේවක අර්ථ සාධක අරමුදල	5,027,289.99	2,876,767.26	2,541,168.90
සේවක අර්ථ සාධක අරමුදල	1,084,791.20	881,740.37	507,727.05
විදේශ ගමන් වියදම්	-	-	-
තෑගි වවුචර් වියදම්	670,000.00	378,830.00	646,847.50
පාරිතෝෂික දීමනා	4,766,131.08	2,779,683.74	1,184,500.55
අන්තර්ජාල වියදම්	245,934.48	339,451.57	447,271.63
කම්කරු වියදම්	8,250.00	36,000.00	39,895.00
වෙනත් වියදම්	-	1,350.00	11,000.00
පුවත්පත් මිලට ගැනීමේ වියදම්	63,220.00	94,625.00	118,145.00
අලුත් වැඩියා නඩත්තු - කාර්යාලීය උපකරණ	93,895.00	145,544.52	79,135.00
අලුත් වැඩියා නඩත්තු - නිශ්පාදන උපකරණ	391,034.85	625,912.49	672,398.47
අධිභාර වියදම්	-	-	102,564.57
තැපැල් ගාස්තු	26,319.00	14,550.70	28,970.00
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	1,477,297.04	1,621,862.03	1,475,598.52

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.	2017 රු.
වෘත්තීය ගාස්තු	95,000.00	30,000.00	-
ගිවිසුම් අලුත් කිරීම	16,900.00	-	12,000.00
ලියාපදිංචි ගාස්තු	182,269.81	103,035.00	90,665.00
සංග්‍රහ වියදම්	146,869.56	1,740.00	-
වැටුප් හා වේතන	38,306,184.77	34,465,547.39	37,732,241.83
ආරක්ෂක සේවා වියදම්	678,190.00	722,252.00	1,073,830.00
ඉඩකඩ වෙන්කර ගැනීම (තාවකාලික)	32,200.00	31,000.00	3,000.00
සේවක රක්ෂණ	2,075,639.45	2,259,260.66	2,545,397.07
සේවක අතිකාල සහ යැපීම් දීමනා	2,693,804.71	2,369,962.74	2,231,596.43
සේවක සුභසාධනය	1,055,597.54	882,590.69	868,703.05
දුරකතන ගාස්තු	480,287.93	424,842.41	577,366.85
ටෙන්ඩර් ගාස්තු	165,096.00	56,600.00	24,500.00
පුහුණු කිරීමේ වැඩසටහන්	569,472.40	31,200.00	118,250.00
පරිවර්තන ගාස්තු	313,507.50	437,397.50	209,800.00
වාහන කුලී	-	460,000.00	1,605,000.00
පානීය ජලය	334,720.15	285,694.22	284,155.04
වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම්	44,200.00	5,000.00	17,800.00
	76,773,888.13	**67,378,237.30**	**71,096,270.58**

සටහන - 15 - අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්

නිර්මාණ ගාස්තු	65,000.00	480,400.00	2,001,522.00
බොල්ණය	-	1,864,995.28	2,994,377.69
සම්බන්ධීකරණ ගාස්තු	-	-	485,510.00
නිර්මාණාත්මක නියෝජිත කොමිස්	-	279,645.63	-
මෝටර්රථ වාහන ක්ෂය වීම්	-	134,479.00	708,191.67
ඉන්ධන වියදම්	630,526.28	815,531.18	789,748.34
මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම්	805,444.68	689,321.37	924,967.40
මුද්‍රණ වියදම්	53,234.78	83,250.00	68,254.00
අලෙවි දිරි දීමනා	1,771,419.93	781,255.71	1,748,539.59
අලෙවි ප්‍රවර්ධන හා දැන්වීම්	9,000.00	79,160.00	526,365.69
විශේෂ වට්ටම්	15,134,514.19	16,105,880.68	15,196,477.91
විශේෂ ඉසව් කටයුතු වියදම්	1,391,134.74	-	444,800.00
ණය අයකර ගැනීමේ වියදම්	33,500.00	-	5,000.00
මුද්දර ගාස්තු	11,653.01	18,950.00	16,355.40
ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීම්	446,544.10	160,047.24	174,448.82
වාහන රක්ෂණ	27,259.00	399,751.09	147,307.91
	20,379,230.71	**21,892,667.18**	**26,231,866.42**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.	2017 රු.
සටහන - 16 - මූල්‍ය වියදම්			
බැංකු ගාස්තු	171,492.68	207,072.73	103,220.70
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	24,672.24	17,034.39	20,863.90
කල්බදු පොලී	-	-	-
රුඳවුම් බද්ද	641.49	700.54	-
	196,806.41	**224,807.66**	**124,084.60**
සටහන - 17 - වෙනත් වියදම්			
ගිණුම්කරණ මෘදුකාංග	341,965.07	273,033.00	309,998.00
ජාලකරණ මෙහෙයුම්	308,900.00	341,965.00	341,955.07
සේවක වන්දි	992,080.00	-	-
වියදම් - රාජගිරිය කාර්යාලය	-	-	187,260.18
වත්කම් විකිණීමේ ලාභය / අලාභය	-	-	61,369.34
විවිධ වියදම්	11,336.80	16,796.00	55,265.00
නෛතික වියදම්	1,557,990.62	1,050,000.00	797,130.00
අනෙකුත් වියදම්	-	9,000.00	17,365.00
	3,212,272.49	**1,690,794.00**	**1,770,342.59**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන් - 18 දේපල පිරියත හා උපකරණ

	01.01.2019 දිනට පිරිවැය රු. ශත.	එකතු කිරීම් / මාරු කිරීම් රු. ශත.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු. ශත.	31.12.2019 දිනට පිරිවැය රු. ශත.
18.1 දළ වත්කම්				
ලීබඩු සහ සවිකිරීම්	3,423,146.48	175,605.28	-	3,598,751.76
පරිගණක උපාංග	7,881,541.00	723,410.00	-	8,604,951.00
කාර්යාල උපකරණ	5,090,597.35	528,926.00	94,900.00	5,524,623.35
මොටර් රථ	9,080,824.00	-	1,245,000.00	7,835,824.00
කැමරා සහ උපකරණ	15,148,200.00	-	-	15,148,200.00
	40,624,308.83	**1,427,941.28**	**1,339,900.00**	**40,712,350.11**

	01.01.2019 දිනට ශේෂය රු. ශත.	වර්ෂය සඳහා ක්ෂය / මාරු කිරීම් රු. ශත.	ඉවත් කිරීම් / ශේෂ ගැලපුම් රු. ශත.	31.12.2019 දිනට ශේෂය රු. ශත.
18.2 ක්ෂයවීම්				
ලී බඩු සහ සවිකිරීම්	1,926,999.31	255,957.68	-	2,182,956.99
පරිගණක උපාංග	6,699,433.03	431,187.01	-	7,130,620.04
කාර්යාල උපකරණ	2,894,835.83	412,515.54	29,303.55	3,278,047.82
මොටර් රථ	9,080,824.27	-	1,245,000.00	7,835,824.27
කැමරා සහ උපකරණ	10,318,451.80	1,147,077.00	-	11,465,528.80
	30,920,544.24	**2,246,737.23**	**1,274,303.55**	**31,892,977.92**
	9,703,764.59			**8,819,372.19**

සටහන - 18-A අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ මෘදුකාංග	3,389,000.00	-	-	3,389,000.00
ජාලකරණ මෙහෙයුම්	3,419,650.72	-	-	3,419,650.72
	6,808,650.72	**-**	**-**	**6,808,650.72**

ක්‍රමක්ෂය

ගිණුම්කරණ මෘදුකාංග	1,625,868.75	309,900.00	-	1,934,768.75
ජාලකරණ මෙහෙයුම්	1,623,176.21	341,965.07	-	1,965,141.28
	3,249,044.96	650,865.07	-	3,899,910.03
	3,559,605.76			**2,908,740.69**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2019 රු.	2018 රු.	2017 රු.
සටහන - 19 - ස්ථාවර තැම්පතු				
ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593		500,000.00	500,000.00	500,000.00
ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව		398,200.00	398,200.00	398,200.00
ලංකා බැංකුව - ගිණුම් අංකය 83636019		7,000,000.00	7,000,000.00	-
මහජන බැංකුව - ගිණුම් අංකය 2006001000052421		8,000,000.00	8,000,000.00	-
මහජන බැංකුව B-581908		5,000,000.00	5,000,000.00	-
ලංකා බැංකුව - ගිණුම් අංකය 84622785		1,500,000.00	-	-
මහජන බැංකුව - ගිණුම් අංකය 2006-00100005485-7		10,000,000.00	-	-
		32,398,200.00	**20,898,200.00**	**898,200.00**
සටහන - 20 - වෙළඳ හා ලැබිය යුතු දෑ				
වෙළෙඳ ණය ගැතියෝ	**20.1**	367,065,848.82	437,737,683.52	365,368,348.55
උත්සව අත්තිකාරම්		122,500.00	42,500.00	40,000.00
සේවක ණය		3,233,910.59	3,170,029.30	2,995,587.95
වැටුප් අත්තිකාරම්		-	-	21,000.00
ලැබිය යුතු රක්ෂණ වාරික		283,063.56	128,235.71	171,625.16
සේවකයන්ගෙන් ලැබිය යුතු - වෙනත්		182,846.93	100,843.85	496,388.20
බැංකු ඇපකර		1,398,000.00	3,558,119.35	1,179,738.08
රඳවා ගැනීමේ බදු		82,459.41	2,212.74	2,212.74
ආර්ථික සේවා ගාස්තු		3,599,744.00	3,599,744.00	3,599,744.00
උපාලි පුවත්පත් සමාගම		10,695.00	10,695.00	10,695.00
ලැබිය යුතු දඩ හා අධිභාරය		194,067.50	199,067.50	199,067.50
අවිනිශ්චිත ගිණුම		-	-	76.63
චික්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		2,538,028.86	2,538,028.86	2,538,028.86
විජය පුවත්පත් සමාගම		188,650.74	188,650.74	188,650.74
ඊඒපි		3,004.00	3,004.00	3,004.00
ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව		63,558.00	63,558.00	63,558.00
ආපසු ගෙවන තැන්පතු		1,260,500.00	1,137,000.00	1,327,000.00
සෙලින්කෝ රක්ෂණ		-	-	41,800.00
ලැබිය යුතු බැංකු පොලී		986,123.38	535,380.68	59,730.00
සේවක මුදල් වංචාව	**සටහන 20.2**	11,988,000.00	11,988,000.00	11,988,000.00
විවිධ ලැබීම්		198,851.01	176,563.45	1,647.10
ඊ-මංසල පාලන ගිණුම		367,917.35	367,917.35	355,417.35
		393,767,769.15	**465,547,234.05**	**390,651,319.86**
සටහන - 20.1 - වෙළෙඳ ණයගැතියෝ				
වෙළෙඳ ණයගැතියෝ		380,483,667.41	451,976,993.49	377,742,663.24
අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම්		(13,417,818.59)	(14,239,309.97)	(12,374,314.69)
		367,065,848.82	**437,737,683.52**	**365,368,348.55**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු. ශත.	2018 රු. ශත.	2017 රු. ශත.
සටහන - 20.2 - සේවක මුදල් වංචාව			
ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිලිබඳව පොලිස් මූල්‍ය අපරාධ අංශය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.			
සටහන - 21 - තැන්පතු හා පෙර ගෙවීම්			
වාහන සඳහා කලින් ගෙවීම්	-	-	-
කලින් කල ගෙවීම්	1,669,896.08	1,395,510.60	1,662,656.66
	1,669,896.08	**1,395,510.60**	**1,662,656.66**
සටහන - 22 - මුදල් මුදල් සමාන දෑ			
ලංකා බැංකුව ගි.අ. 2323299	3,078,297.75	7,540,695.27	29,724,501.94
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765	327,395.69	315,207.27	291,145.04
මහජන බැංකුව (ජංගම) ගි.අ. 200100130005980	(3,652,842.49)	3,467,878.97	791,574.32
මහජන බැංකුව (ඉතිරි කිරීමේ) ගි.අ. 200100110005980	27,571,332.74	-	-
නිශ්පාදන අත්තිකාරම්	141,808.50	1,881,603.50	424,234.50
වෙනත් අත්තිකාරම්	220,501.96	175,000.00	185,000.00
	27,686,494.15	**13,380,385.01**	**31,416,455.80**
සටහන - 23 - ගෙවිය යුතු පාරිතෝෂික			
ඉ / ගෙ ශේෂය	11,919,393.60	9,692,481.86	8,639,956.56
පාරිතෝෂක වියදම් වර්ෂය සඳහා	4,766,131.08	2,797,621.74	1,052,525.30
	16,685,524.68	12,490,103.60	9,692,481.86
පාරිතෝෂක ගෙවීම්	(303,817.51)	(570,710.00)	-
ගෙවිය යුතු පාරිතෝෂක	**16,381,707.17**	**11,919,393.60**	**9,692,481.86**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන - 24 පොළී ගෙවිය යුතු ණය හා ණය ගැනීම්

	2019 වසර 1 ක් තුළ මුදල් ආපසු ගෙවිය යුතු	2019 වසරකට පසුව ආපසු ගෙවිය යුතු	2019 මුළු එකතුව	
මූල්‍ය බදු	-	-	-	
	-	-	-	

සටහන - 24.1 මූල්‍ය බදු

	01.01.2019 දිනට	ලබාගත් නව බදු	ආපසු ගෙවීම්	31.12.2019 දිනට
ලංකා බැංකුව				
මිට්සුබිසි වෑන් රථය	-		-	-
	-	-	-	-
	-	-	-	-

සටහන - 24.2 අනාගත කාලසීමාව සඳහා වෙන්කල මූල්‍ය ගාස්තු

	01.01.2019 දිනට	ලබාගත් නව බදු	ආපසු ගෙවීම්	31.12.2019 දිනට
ලංකා බැංකුව				
මිට්සුබිසි වෑන් රථය	-	-	-	-
	-	-	-	-
	-			-

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2019 රු.	2018 රු.	2017 රු.
සටහන - 25 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ			
වෙළෙඳ ණයහිමියෝ	233,977,260.16	255,513,856.90	239,504,342.38
දුරකතන ගාස්තු	47,302.86	47,302.86	47,302.86
ගෙවිය යුතු අලෙවි කොමිස්	972,547.56	-	716,321.22
උපචිත මුද්දර ගාස්තු	1,800.00	4,075.00	1,375.00
උපචිත ගෙවිය යුතු බද්ද	-	-	4,830.12
චිකතුකල අගය මත බද්ද	22,337,661.67	49,568,361.22	54,853,633.70
ජාතිය ගොඩනැගීමේ බද්ද	24,449,624.38	21,700,413.36	18,466,322.67
ගෙවිය යුතු ගෙවල් කුළී	900,000.00	900,000.00	900,000.00
ආර්ථික සේවා ගාස්තු	-	-	-
වෙනත් ණය හිමියෝ	9,143,097.35	14,244,094.15	1,885,523.10
විගණන ගාස්තු	-	424,000.00	174,000.00
ඉන්ධන	41,651.47	41,651.47	41,651.47
වැටුප් පාලන හිණුම	42,938.56	42,938.56	11,458.16
අවිනිශ්චිත හිණුම	10,353.47	10,353.47	-
පාලන හිණුම - Vision 2020 President Secretariat	616,896.00	616,896.00	-
උපචිත වියදම්	33,731,031.59	51,372,047.63	46,305,017.78
ආපසු ගෙවන තැන්පතු	77,500.00	-	-
	326,349,665.07	**394,485,990.62**	**362,911,778.46**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2019 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන - 26 - සම්බන්ධිත පාර්ෂවයන් හෙලිදරව් කිරීම (LKAS 24)

නම	තනතුර	සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය	ලිපිනය
ඒ.විත්.ආර්. සුබසිංහ	සභාපති (වැ.බ)	නැත	අංක. 164, කුමාරතුංග මාවත, ගම්පහ
මංජුල තේරත්	සාමාන්‍යාධිකාරී	නැත	අංක. 52, කොම්පෙයාහේන පාර, හෝමාගම.

2019 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු සිදුනොවීය.

සටහන - 27 - ගොඩනැගිලි අලුත්වැඩියා වියදම්

ගොඩනැගිලි අදුත්වැඩියා සඳහා දරන ලද වියදම් තුළ මූලධන ස්වරූපයේ වියදම් ද ඇතුළත් බැවින්, ආයතනය විසින් බදුකරු සමඟ ඇති කරගත් ගිවිසුම වලංගු වසර 5 ක කාලය තුළ ලියා හැරීමට කටයුතු කර ඇත.

සටහන - 27 - පෙර වර්ෂයේ ගැලපීම්

ක්ෂය නිවැරදි කිරීම	8,997.55
ණයගැතිශේෂ නිවැරදි කිරීම	(9,374,257.49)
උපචිත වියදම් නිවැරදි කිරීම	18,496,353.02
ලෙජර් ගිණුම නිවැරදි කිරීම	(2,905,945.67)
ණයහිමියන් නිරවුල් කිරීම	62,840.34
පාරිතෝෂික වියදම් නිවැරදි කිරීම	9,525.01
	6,297,512.76

2019 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඒඒ/සී/එස්ටීඅයි/04/2019/එෆ්ඒ[illegible] | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 පෙබරවාරි 16 දින

සභාපති
සැලසිනේ රූපවාහිනී ආයතනය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 08 දින වන විට ඉදිරිපත් කර නොතිබූ හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල ගණුදෙනු වාර්තාවක් 2021 අගෝස්තු 03 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2021 ඔක්තෝබර් 07 වන දින ඉදිරිපත් කර ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා කරන තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස/වෙනස්කම් ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර.3 - "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි" ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිරිවැය රු.15,272,938 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය රු.24,271,575 ක් වූ දේපල, පිරියත හා උපකරණ අතුරින් පිරිවැය රු.3,052,278 ක් වූ වත්කම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ගෙවිය යුතුව පැවති රු.315,000 ක් වූ ගොඩනැගිලි කුලී උපචිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. එම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වුණි.

(ඈ) රු.23,468,011 ක් වූ ලැබිය යුතු සහ අත්තිකාරම් ශේෂ සම්බන්ධයෙන් සහ රු.58,641,374 ක් වූ වෙනත් ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ණයගැති/ණයහිමි උපලේඛන, වයස් විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සේවක ණය ශේෂය වූ රු.3,233,910 ක මුදල හා ඊට අදාලව ඉදිරිපත් කර තිබුණු විස්තරාත්මක උපලේඛනයේ සඳහන් ශේෂය අතර රු.588,411 ක වෙනසක් නිරීක්ෂණය වුවද එකී වෙනසට හේතුව විගණනයට පැහැදිලි නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2 (1) (අ) වගන්තිය	යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබිය යුතු වුවත්, 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් විගණන දිනය වන විටත් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, ආයතනය විසින් ආසන්න වසර 3 ක, එනම් 2017, 2018 සහ 2019 වර්ෂවල පිළිවෙලින් රු.1,210,436 ක්

රු.29,704,436 ක් සහ රු.8,300,209 ක් වශයෙන් ලාභ උපයා තිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DMS/1595 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය

(i) අදාල ලිපිය මඟින්, කොන්ත්‍රාත් පදනම මත තනතුරු 18 ක් අනුමත කර ඊට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර තිබුණද කළමණාකරු (මූල්‍ය) තනතුර හැර අනෙකුත් තනතුරුවලට අදාලව බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) උක්ත සඳහන් ලිපිය පරිදි, කොන්ත්‍රාත් පදනම මත අලෙවි විධායක තනතුරු 6 ක් අනුමත කර, "සුදුසුකම් මත වැටුප තීරණය කළ යුතු හෙයින් තනතුරට අදාල බඳවා ගැනීමේ සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස" දන්වා තිබුණද, අදාල තොරතුරු ඉදිරිපත් කර අනුමත කර ගැනීමෙන් තොරව එම තනතුරු වලට අදාලව වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය

චක්‍රලේඛය ප්‍රකාරව, අවම වශයෙන් මාස තුනකට වරක් හෝ විගණන කළමණාකරන කමිටුව රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

03 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් ගොඩනැඟිල්ලක් 2014 ජනවාරි 15 සිට 2019 ජනවාරි 14 දක්වා බදු පදනම මත ලබා ගෙන තිබුණද අදාල දිනයෙන් පසු ගොඩනැඟිල්ලෙන් ඉවත් වීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ඊට අදාලව 2021 මාර්තු 12 දින එන්තරවාසියක් යොමුකර එදින සිට දින 14 ක් ඇතුළත ගොඩනැඟිල්ලෙන් ඉවත් වන ලෙසද දන්වා තිබුණි. එසේ වුවද ගිවිසුම අළුත් කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට හෝ කටයුතු කර නොතිබූ අතර විගණන දිනය වූ 2021දෙසැම්බර් 30 දින වන විටත් අදාල ගොඩනැඟිල්ලෙන් ඉවත් වීමට කටයුතු කර නොතිබුණි. තවද, 2014,2017 සහ 2018 යන වර්ෂවලට අදාලව ජලය හා විදුලිය වියදම් වශයෙන් රු.758,764 ක මුදලක් ගෙවිය යුතුව ඇති බව ඉහත සඳහන් එන්තරවාසියේ දක්වා තිබුණද අදාල මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලද හෙළදරව් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී හෙළිදරව් කර ගනු ලැබූ ආයතනයේ සේවකයෙකු විසින් සිදු කරනු ලැබූ මුදල් වංචාව සම්බන්ධයෙන් ලැබිය යුතු රු.11,988,000 ක මුදල වර්ෂ 05 ක් ගත වුවද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දින ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 70 දෙනෙකු වූ අතර ඉන් 31 දෙනෙකු ස්ථිර සේවකයන්ද 39 දෙනෙකු කොන්ත්රාත් පදනම මත බඳවා ගත් සේවකයන්ද විය. එදිනට තත්ය කාර්ය මණ්ඩලය 67 ක් වූ අතර ඉන් 15 දෙනෙකු ස්ථිර සහ 52 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ සේවකයින් විය.ඒ අනුව, ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් සහ අතිරික්තය 05 ක් වූ අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 7 ක් සහ අතිරික්ත 20 ක අතිරික්තයක් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති